සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

## ගෘහ ආර්ථික විද්‍යාව - I

පැය එකයි
One hour

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01 සිරුරේ වර්ධනයට මෙන්ම, රුධිරයේ අඩංගු හිමොග්ලොබින් නිපදවීම සඳහා අවශ්‍ය පෝෂකය වනුයේ,

(1) කාබෝහයිඩ්‍රේටය (2) ප්‍රෝටීනය (3) විටමින් වර්ගය (4) මේදය

02 බිත්තරවල අඩංගු ප්‍රෝටීනය වනුයේ,

(1) කේසීනය (2) මයෝසීනය (3) ග්ලූටනීනය (4) ඇල්බියුමීනය

03 ශීතකරණයේ - 18 $^{o}$C උෂ්ණත්වයක් ඇති කොටසේ තැන්පත් කිරීමට සුදුසු ආහාර වන්නේ,

(1) පුඩිං වර්ග, පාන වර්ගය. (2) බිත්තර හා ජෙලි වර්ගය.
(3) මස් හා මාළු වර්ගය. (4) එළවළු හා පළතුරු වර්ගය.

04 බීටා කැරොටීන් බහුලව අඩංගුවන ආහාර ප්‍රභවයක් වන්නේ,

(1) වට්ටක්කා හා ලාවුළුය (2) බිත්තර කහ මදය හා බටර්ය
(3) කිරි නිෂ්පාදන හා කිරිය (4) පීකුදු හා කිරිය

05 ක්ෂුද්‍ර ඛනිජ කාණ්ඩයට අයත් පෝෂක වනුයේ,

(1) පොටෑසියම්, මැග්නීසියම් ය. (2) සෝඩියම්, පොටෑසියම් ය.
(3) සින්ක්, ෆ්ලෝරයිඩ් ය. (4) සින්ක්, සෝඩියම් ය.

06 කිරි ප්‍රෝටීන මත ක්‍රියා කරන එන්සයිමය වනුයේ,

(1) පෙප්සීන් ය. (2) ට්‍රිප්සීන්ය ය. (3) රෙනින් ය. (4) ටයලීන් ය.

07 අස්ථි වර්ධන සඳහා අත්‍යාවශ්‍ය ඛනිජ වර්ගය වනුයේ,

(1) යකඩය (2) අයඩීන්ය (3) පොටෑසියම්ය (4) කැල්සියම්ය

08 මහා පෝෂකයක් වන ලිපිඩ නිර්මාණය වී ඇත්තේ කුමන සංයෝගයක් එක් වීමෙන් ද?

(1) අසංතෘප්ත මේද අම්ල සංයෝග වීමෙනි. (2) මේද අම්ල හා ග්ලිසරෝල් අණු එක්වීමෙනි.
(3) සංතෘප්ත මේද අම්ල සංයෝග වීමෙනි. (4) බහු අසංතෘප්ත මේද අම්ල එක්වීමෙනි.

09 හෘදයාබාධ රෝගීන්ට වඩාත්ම සුදුසු මේද අම්ලය වන්නේ,

(1) ඔමේගා 3 ය. (2) මිරිස්ටික් අම්ලය (3) ඔලෙයික් අම්ලය (4) පාමිටික් අම්ලය

10 වඳභාවය ඇතිවීම කෙරෙහි බලපාන විටමින් වර්ගය වන්නේ,

(1) විටමින් A ය. (2) විටමින් D ය. (3) විටමින් E ය. (4) විටමින් K ය.

11 රතු රුධිරාණු නිෂ්පාදනයට විටමින් B කාණ්ඩයේ විටමිනයක් උපකාරී වේ. එම විටමිනය වන්නේ,

(1) පැන්ටොතෙනික් අම්ලය (2) ෆෝලික් අම්ලය

(3) පිරිඩොක්සින් (4) සයනොකොබැලමින්

12 මුඛය තුළදී කාබෝහයිඩ්‍රේට්, ඛේටමය ඇමැයිලේස් මගින් ජල විච්ඡේදනය වී සාදන සැකරයිඩය වන්නේ,

(1) මෝල්ටෝස් ය. (2) ෆෲක්ටෝස් ය. (3) ග්ලූකෝස් ය. (4) ගැලැක්ටෝස් ය.

13 ආහාරයට ගන්නා 'මාළු'වල අඩංගු ප්‍රෝටීන පෝෂකය ආමාශයේ දී පෙප්සීන් එන්සයිමය හා ක්‍රියාකර,

(1) ගැලැක්ටෝස් බවට පත් වේ. (2) මේද අම්ල බවට පත් වේ.

(3) ඇමැයිනෝ පෙප්ටයිඩේස් බවට පත්වේ. (4) පෙප්ටෝන පෙප්ටයිඩ බවට පත් වේ.

14 පැලවීගෙන එන ධාන්‍යවලින් ලබා දෙන කාබෝහයිඩ්‍රේට විශේෂයකි,

(1) සුක්රෝස් (2) ෆෲක්ටෝස් (3) ලැක්ටෝස් (4) මෝල්ටෝස්

15 ආහාර තුළ සිදුවන එන්සයිම ක්‍රියාකාරිත්වය මගින් සිදුවන මේරීම හා ඉදීම හඳුන්වන්නේ,

(1) ස්වයං වියෝජනය ලෙසය (2) මුඩු වීම ලෙසය

(3) එන්සයිමීය දුඹුරු පැහැගැන්වීම ලෙසය (4) ආර්ධතාවය වෙනස්වීම ලෙසය

16 දියාරු පිටිමෝලියට උදාහරණයකි

(1) මාළු පාන් පිටි මිශ්‍රණය (2) පැන් කේක් පිටි මිශ්‍රණය

(3) පැටි පිටි මිශ්‍රණය (4) පෆ් පේස්ට්‍රි පිටි මිශ්‍රණය

17 පිටි මෝලිය අත් ගැසීමේ දී පිටි මෝලිය තුල ඇති කාබන්ඩයොක්සයිඩ් වායුව පැතිර යාමට හේතු වන පිටිවල අන්තර්ගත ප්‍රෝටීනය වනුයේ,

(1) සෙයින් ය. (2) ග්ලූටනීන් ය. (3) ලෙගියුමීන් ය. (4) ඔරයිසීන් ය.

18 නව යොවුන් අවධියේ දී ඇති වන ප්‍රාථමික ලිංගක ලක්‍ෂණයක් නොවන්නේ,

(1) ඩිම්බකෝෂ හා ගර්භාෂය වර්ධනය (2) වෘෂණ කෝෂ වෘෂණ වර්ධනය

(3) උස හා බර වැඩි වීම (4) ප්‍රජනක ඉන්ද්‍රිය පද්ධතියේ වර්ධනය

19 ගර්භනි අවධියේ ඇති විය හැකි අවධානම් සාධකයක් වන්නේ,

(1) වමනය (2) මලබද්ධය (3) පාද ඉදිම්මුව (4) අධික රුධිර පීඩනය

20 ඩිම්බහරණය යනු,

(1) නව යොවුන් දැරියක මල්වර වීමයි.

(2) පරිනත ඩිම්බයක් පැලෝපීය නාලයට මුදා හැරීමයි

(3) ගර්භනීභාවයට පත් වීමයි

(4) ගබ්සා වීමයි

21 වෘෂණ කෝෂ මඟින් කෙරෙන කාර්යයකි.

(1) ශුකාණු නිෂ්පාදනය (2) පුරුෂ ප්‍රජනක හෝමෝන නිෂ්පාදනය

(3) වෘෂණයට ආරක්ෂාව සැපයීම (4) ශුක්‍රාණු ශිෂ්නය වෙත යොමු කිරීම

22 ඩිම්බයක සජීවී කාලය කොපමණ ද?

(1) දින එකක් පමණි (2) දින දෙකක් පමණි

(3) දින තුනක් පමණි (4) දින දාහතරක් පමණි

23 ගර්භනී අවධියේ දී ෆෝලික් අම්ලය විශේෂයෙන් අවශ්‍ය වන්නේ,

(1) ගර්භනී මවගේ රුධිර පරිමාව වැඩි කිරීමටය.

(2) භ්‍රෑණයාගේ ස්නායු පද්ධතියේ වර්ධනයටය.

(3) ගර්භනී කාලයේ සංකූලතා අඩු වීමටය.

(4) භ්‍රෑණයාට ප්‍රතිශක්තිකරණය ඇති කිරීමටය.

24 ශ්‍රවණ හා කථන ආබාධ හා මන්ද මානසික දරු උපත් සිදු වීමට හේතුවක් වන පෝෂක ඌනතාවය වන්නේ,

(1) අයඩීන් ඌනතාවයයි (2) යකඩ ඌනතාවයයි

(3) ෆෝලික් අම්ල ඌනතාවයයි (4) කැල්සියම් ඌනතාවයයි

25 ගර්භනී අවධියේ බලපෑම් කළ හැකි සංජානනීය රෝග වන්නේ,

(1) තැලසීමියාව හා හිමෝෆිලියාව (2) අධිරුධිර පීඩනය හා කොලෙස්ට්‍රරෝල්

(3) දියවැඩියාව හා ඇදුම (4) ඒඩ්ස් සහ සිෆිලිස්

26 භ්‍රෑණ අවධියේ කාලසීමාව වන්නේ,

(1) සංයේචනයේ සිට මාස දෙක දක්වාය. (2) සංයේචනයේ සිට මාස හතර දක්වාය.

(3) මාස දෙකේ සිට ප්‍රසවය දක්වාය. (4) සාම දෙකේ සිට මාස 4 දක්වාය.

27 මාතෘ සායනයේ දී එක් දිනක් පමණක් කරනු ලබන පරීක්ෂාවක් වන්නේ,

(1) බර මැනීම (2) උස මැනීම (3) මුත්‍රා පරීක්ෂාව (4) රුධිර පරීක්ෂාව

28 අක් සැරසිල්ලක් නොවන්නේ,

(1) රේන්ද ඇල්ලීම (2) රැලිපටි ඇල්ලීම (3) බඳින යෙදීම (4) සැනගාංචු ඇල්ලීම

29 ශාකමය කෙඳි වර්ගයක් වන්නේ,

(1) සේද කෙඳිය. (2) ලිනන් කෙඳිය. (3) රන් කෙඳිය. (4) රෙයෝන් කෙඳිය.

30 ළදරු ඇඳුම් සඳහා යොදාගනු ලබන මූට්ටුව වන්නේ,

(1) පැතලි මූට්ටුවයි (2) අතිජාදන මූට්ටුවයි

(3) විවෘත පැතලි මූට්ටුවයි (4) ප්‍රංශ මූට්ටුවයි

31 ආරෝපණය කිරීමට (ඇප්ලික්) යොදා ගන්නේ,

(1) පිරවුම් මැස්මයි (2) බ්ලැන්කට් මැස්මයි

(3) හුරුළු කටු මැස්මයි (4) මී වද මැස්මයි

32 මෙම මෝස්තරය මැසීමට වඩාත් යෝග්‍ය වන්නේ,



(1) සැටින් මැස්ම හා ශුපැළුකාටු මැශ්මය

(2) ලේසිඩේසි මැස්ම හා දම්වැල් මැස්ම

(3) නැටි මැස්ම හා දම්වැල් මැස්ම

(4) නැටි මැස්ම හා ප්‍රංශ ගැට මැස්ම

33 ලිපි රඳනයේ අද්දර නිම කිරීමට වඩාත් සුදුසු වන්නේ,

(1) විකර්ණාකාර පටියක් අල්ලා බඳන යෙදීම (2) දික් පටියක් අල්ලා නමා මැසීම

(3) එම රෙද්දෙන්ම වාටිය නමා මැසීම (4) රේන්ද ඇල්ලීම

34 ගැටයකින් ආරම්භකර පිස්මේන්තුවකින් අවසන් කරන්නේ,

(1) හීන් නූල් මැස්ම (2) වාටි මැස්ම (3) පිස්මේන්තු මැස්ම (4) නූල් ඇදීම

35 මැසීමේ ශිල්පීය ක්‍රම වන්නේ,

(1) කර නිමාව හා බ්ලැන්කට් මැස්මයි (2) කර නිමාව හා ප්‍රංශ මූට්ටුවයි

(3) නූල් ඇදීම හා ආර යෙදීමයි (4) ඉන රැලි කිරීම හා කතිර මැස්මයි

36 "පවුලක්" යනු ජීවත් වීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය හා මූලාශ්‍ර, සම්පත් බෙදා හදා ගනිමින් කාලයක් තිස්සේ එකම ඉලක්කයක් කරා යාමට සංවිධානය වන, එකිනෙකා අතර බලපෑම් ඇති කරන පුද්ගලයින්ගේ සමන්විත සහයෝගි ඒකකයකි. මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද විද්‍යාඥයා වන්නේ,

(1) හොක් සහ පැවොලුසි (2) කැත්ලින් ගෆ්

(3) විලියම් ගිල්බ්‍රත් (4) ජී. පී. මර්ඩෝක්

37 ගෘහයක් ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කිරීමට වඩාත් උචිත ක්‍රමය වන්නේ,

(1) අලංකාරයට මුල් තැන දෙමින් නිවාස සැලසුම් කිරීමය

(2) භූමියේ හැඩය හා පිහිටීම වෙනස් නොකර, ඒ අයුරින්ම නිවාස ගොඩ නගා ගැනීමයි

(3) වැය කිරීමට හැකි වියදම නොසලකා හරිමින් සැලසුම් සකස් කිරීමයි

(4) නිතරම පරිසර හානිය සිදු නොවන බැවින් ගෘහය සැලසුම් කර තිබීමයි

38 විවිධ කාර්යයන් අවම ශ්‍රමයකින් සිදු කර ගැනීමට හා උපරිම පහසුකම් සලසා ගත හැකි ආකාරයට නිවසේ කොටස් යාබද ව ගොනු කිරීම හඳුන්වනුයේ,

(1) පරිමාණය වශයෙනි (2) පිහිටි අත යනුවෙනි

(3) රාශීකරණය යනුවෙනි (4) සංවහනය යනුවෙනි

39 ගෘහ කාර්යයන් කිරීමේ දී අවශ්‍ය මානව සාධක වනුයේ,

(1) කාලය, මුදල්, විදුලිය (2) විදුලිය, ආකල්ප, දැනුම, කාලය

(3) මුදල්, ආකල්ප, කාලය හා ශ්‍රමය (4) ශ්‍රමය, දැනුම, ආකල්ප

40 නිදන කාමරයේ බිත්ති සඳහා ලා නිල් පැහැය යොදාගෙන තිබූ අතර තැඹිලි වර්ණයෙන් යුත් බිත්ති සැරසිල්ලකින් කාමරය අලංකාරවත් වී තිබුණි. මෙහිදී පෙන්නුම් කරනු ලබන වර්ණ ගැලපුම වනුයේ,

(1) ඒක වර්ණ ගැලපුමය (2) විරුද්ධ වර්ණ ගැලපුමය

(3) බද්ධ වර්ණ ගැලපුමය (4) උණුසුම් වර්ණ ගැලපුමය

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

# ගෘහ ආර්ථික විද්‍යාව - II

පැය දෙකයි
Two hours

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර අසා ඇති කෙටි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

මාස තුනක් වයසැති දියණියකගෙන් සෙනෙහස විඳින ප්‍රබෝධි තමාටම නව නිවසක් ඉදිකර ගැනීමේ සිහිනය දකිමින් සිටින්නීය. අයගේ සැමියා ද අනාගතයට අවශ්‍ය අඩිතාලම දමමින් තම පවුලට ගැළපෙන ඉඩමක් සොයමින් සිටින්නේය. එම යුවල මේ වන විටත් නිවසේ සැලසුම සහ ගෘහය අලංකරණය කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කරමින් සිටි

(i) ප්‍රබෝධිගේ පවුල අයත් වන්නේ කුමන පවුල් වර්ගයට ද?

(ii) කිරි දෙන මවක් වන ඇයගේ විශේෂ පෝෂණ අවශ්‍යතා දෙකක් හේතුව සහිතව සඳහන් කරන්න.

(iii) ඇය ආහාරයට ගන්නා ප්‍රෝටීන් පෝෂකයේ අවසාන ජීරණ ඵලය සඳහන් කරන්න.

(iv) ප්‍රෝටීන් ජීරණය ආරම්භ වන්නේ ජීරණ පද්ධතියේ කුමන ඉන්ද්‍රිය මඟින් ද?

(v) ඇයගේ ආහාර වේලට ඇතුළත් කළ යුතු කැල්සියම් අඩංගු ආහාර දෙකක් නම් කරන්න.

(vi) ඇයගේ දියණියගේ ළදරු ඇඳුම් මැසීම සඳහා තෝරා ගන්නා රෙදිවල තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.

(vii) මාස තුනක් වන දියණිය සඳහා මේ වන විට ප්‍රතිශක්තිකරණ වැඩසටහනින් ලබා දෙන ලද එන්නත් දෙකක් සඳහන් කරන්න.

(viii) නිවසක් තැනීම සඳහා ඉඩමක් තෝරා ගැනීමේ දී එහි තිබිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ix) නිවසක බිම් සැලැස්මක් පරිමාණයට ඇඳීම සඳහා යොදාගන්නා මිනුම් ක්‍රම දෙකකි. ඒවා නම් කරන්න.

(x) නිවස ගොඩ නැගීමෙන් පසු කාමර අලංකරණය සඳහා යොදා ගන්නා උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(02) (i) උපාංග භාවිතයෙන් නිවස තුල සජීවී බවක් මෙන්ම අලංකරණයේ දී ක්‍රියානුරූපී බව ද ඇති කරයි. ගෘහ පිළි සඳහා උපාංග නිර්මාණයේ දී අත්‍යාවශ්‍ය වන

A - මෙවලම් තුනක් හා

B - ද්‍රව්‍ය තුනක් නම් කරන්න.

(ii) නිවසක් අලංකාරය සඳහා කුෂන් කවරයක් නිර්මාණයේ දී පිරි සැලැස්ම සැකසීම වැදගත් වේ. පිරි සැලැස්ම සඳහා අවශ්‍ය කරුණු 3 ක් සඳහන් කරන්න.

(iii) එම කුෂන් කවරය සඳහා යොදා ගත හැකි අක් සැරසිලි ක්‍රම දෙකක් නම් කරන්න. ඉන් එක් ක්‍රමයක් මසා නිම කරන අයුරු රූප සටහනකින් දක්වන්න.

(03) (i) ආහාර ජීරණ ක්‍රියාවලිය ආරම්භ වන්නේ මුඛයේ දීය. මුඛයේ දී ඇරඹෙන ජීරණ ක්‍රියාවලිය කෙටියෙන් සඳහන් කරන්න.

(ii) කාබෝහයිඩ්‍රේට් ජීරණයේ අවසාන ඵල සඳහන් කරන්න.

(iii) කෙටි සටහන් ලියන්න.

ආහාර ජීරණය කෙරෙහි බලපාන සාධක

(a) සායනික සාධක

(b) භෞතික සාධක

(04) (i) ආහාර නරක්වීමට බලපාන ජීව විද්‍යාත්මක හේතු අතර දිලීර වැදගත් වෙයි. දිලීර වර්ග තුනක් නම් කරන්න.

(ii) කිරි ඉතා ඉක්මනින් නරක් වන ආහාරයකි. කිරි නරක්වීම කෙරෙහි බලපාන බැක්ටීරියා වර්ග තුනක් දක්වන්න.

(iii) ගෘහීය මට්ටමින් පරීක්ෂණය කළ හැකි ආහාර වර්ග හතරක් නම් කර ඒවාට සඳහා යොදන පරීක්ෂණ කාරක සඳහන් කරන්න.

(05) (i) ගෘහ අලංකරණය කිරීම සඳහා යොදා ගන්නා මෝස්තර මූල ධර්ම තුනක් සඳහන් කරන්න.

(ii) නිර්මාණකරණයේ දී භාවිතා කරනු ලබන කලා මූලිකාංග තුනක් දක්වන්න.

(iii) නිදන කාමරය අලංකරණය සඳහා යොදා ගත හැකි වර්ණ ගැලපුමක් නම් කර එය යොදා ගත හැකි ස්ථාන තුනක් නම් කරන්න.

(06) (i) ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ වලට අනුව නව යොවුන් අවධියේ වයස් සීමාව දක්වන්න.

(ii) ස්ත්‍රී ප්‍රජනක හෝමෝන දෙකක් හා පුරුෂ ප්‍රජනක හෝමෝනයක් නම් කරන්න.

(iii) ගර්භනී අවධියේ විශේෂ පෝෂණ අවශ්‍යතා හතර සඳහන් කරන්න.

(07) (i) ගර්භනීභාවයේ ලක්ෂණ තුනක් ලියන්න.

(ii) V D R L පරීක්ෂණය මඟින් හඳුනාගත හැකි රෝගය නම්කර එය වැළඳී ඇති ගර්භනී මව්වරුන්ට මුහුණපෑමට සිදුවිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(iii) ඩිම්බහරණය හා අධිරෝපනය පැහැදිලි කරන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (2) | 2 - (4) | 3 - (3) | 4 - (1) | 5 - (3) | 6 - (3) | 7 - (4) | 8 - (2) | 9 - (1) | 10 - (3) |
| 11 - (2) | 12 - (1) | 13 - (4) | 14 - (4) | 15 - (1) | 16 - (2) | 17 - (2) | 18 - (3) | 19 - (4) | 20 - (2) |
| 21 - (3) | 22 - (2) | 23 - (2) | 24 - (1) | 25 - (1) | 26 - (3) | 27 - (2) | 28 - (4) | 29 - (2) | 30 - (1) |
| 31 - (2) | 32 - (3) | 33 - (1) | 34 - (4) | 35 - (2) | 36 - (1) | 37 - (2) | 38 - (3) | 39 - (4) | 40 - (2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් 40 යි.)

## II කොටස

(01) (i) න්‍යෂ්ටික පවුල, ප්‍රාථමික පවුල, සමීප පවුල, ඒකීය පවුල, මූලික පවුල, අණු පවුල (ල. 02)

(ii)
- ප්‍රෝටීන - මව්කිරි නිපද වීම මවගේ පටක වර්ධනය සඳහා
- යකඩ - ප්‍රසූතියේ දී හා ගර්භනී අවධියේ දී වැය වූ යකඩ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා
- කැල්සියම් - අස්ථි ශක්තිමත් වීම සඳහා
- මේදය - මව් කිරි නිපද වීම සඳහා, ශක්ති අවශ්‍යතාන සපුරාලීම සඳහා
- කාබොහයිඩ්‍රේට් - මව් කිරි නිපද වීම සඳහා, ශක්ති අවශ්‍යතාන සපුරාලීම සඳහා (ල. 02)

(iii) ඇමැයිනෝ අම්ල (ල. 02)

(iv) ආමාශය (ල. 02)

(v) කතුරුමුරුංගා / තල / හාල්මැස්සන් (කුඩා මාළු) / කිරි / කජු

(vi)
- ජල අවශෝෂණතාවය තිබීම
- උණුසුමට ඔරොත්තු දීම
- සැහැල්ලු රෙදි වීම
- මෘදු රෙදි වීම

(vii)
- B. C. G එන්නත
- පෙන්ටාවෙපන්ට් එන්නත (පළමු මාත්‍රාව)
- පෝලියෝ එන්නත

(viii)
- වැය කරන මුදලේ වටිනාකමට උචිත වීම
- භූමියේ ස්වභාවය
- භූමියේ ඔප්පුවේ නිරවුල් බව
- යටතල පහසුකම්
- අවට පරිසරය

(ix)
- ඉම්පීරියල් ක්‍රමය - අඟල් අඩි ආදී වශයෙන්
- මෙට්‍රික් ක්‍රමය - සෙන්ටිමීටර්, මීටර් ආදී වශයෙන්

(x)
- මෝස්තර මූලධර්ම
- කලා මූලිකාංග

(02) (i) A ඉඳිකටු, කතුරු, දිදාලය, දෘති රෝදය............... (½ x 3 = 1½)

B දුඹුරු කඩදාසි, සන්නාලි කාබන්, වූල් වර්ග, වර්ණ, මැහුම් ක්‍රම..... යනාදිය අනුව (ලකුණු 03)

(ii) කුෂන් කවර නිර්මාණය සඳහා අවශ්‍ය පතරොම, සුදුසු රෙදි, යොදාගන්නා මෝස්තරය, නූල් වර්ග, වර්ණ ගැලපුම, මුහුම් ක්‍රම යනාදිය (ල. 1 x 3 = 3)

(iii) අක් සැරසිළි - රේන්ද ඇල්ලීම, රැළි පටි ඇල්ලම, බඳන යෙදීම (ලකුණු 02)
රූප සටහන අනුව ලකුණු 02 } (ලකුණු 4)

(03) (i) මුඛ කුහරය තුළදී ආහාර කුඩා කැබලිවලට කැඩීම, බේටය සමග ආහාර කැබලි මිශ්‍ර වීම, ආහාර

පහසුවෙන් ගිලීමට හැකි වීම සිදු වේ. (ල. 03)

(ii) ග්ලූකෝස්, ෆෲක්ටෝස් හා ගැලැක්ටෝස් බවට පත් වීම (ල. 03)

(iii) • සායනික සාධක - ආහාර පිසීමේ දී හමන සුවඳ මෙන්ම, රසවත් ආහාරයක් දැකීමෙන් ඛේටය ඉනීම සිදු වේ. මෙසේ සංවේදී වීමෙන් ජීරණය ග්‍රන්ථවලින්ගෙන් ජීරණ ශ්‍රවයක් ගැලීමට උපකාරී වේ. මෙම ක්‍රියාවලිය සායනික සාධක ලෙස හැඳින්වේ. (ල. 02)

• භෞතික සාධක - ආහාර විකීම, ඇඹරීම, මිශ්‍රවීම, තල්ලුවීම, ගිලීම, ක්‍රමාකුංචනයට භාජණය වීම හා අවශෝෂණය සිදුවීම යන යාන්ත්‍රික ක්‍රියාවන් භෞතික සාධක ලෙස හැඳින්වේ. (ල. 02)

(04) (i) ඇස්පගිලස්, මියුකෝර්, පෙනිසිලියම් (ල. 1 x 3 = 3)

(ii) ස්ට්‍රෙප්ටෝකොකස්, සූඩොමොනාස්, ලැක්ටෝබැසිලස්, මයිකොබැක්ටීරියම් (ල. 1 x 3 = 3)

(iii) ලුණු දෙහි - ලුණු | ජෑම් - සීනි
අච්චාරු - විනාකිරි | චට්නි - විනාකිරි, සීනි යනාදිය. (ල. 1 x 4 = 4)

(05) (i) මෝස්තර මූලධර්ම - තුලනය / රිද්මය / අවධාරණය / එකඟතාවය / සමානුපාතය (ල. 03)

(ii) කලා මූලිකාංගය - රේඛා / වර්ණය / වයනය / හැඩය (ල. 03)

(iii) • ඒක වර්ණක ගැලපුම (ල. 01) -
සිවිලිම - නිල්, ලා නිල්
බිත්තිය - නිල්
බිමට - තද නිල්
(ලකුණු 3)

• බද්ධ වර්ණ ගැලපුම (ල. 01) -
සිවිලිම - තද කොළ
බිත්තිය - කොළ
බිමට - නිල් කොළ
(ලකුණු 3)

(ල. 1 + 3 = 4)

(06) (i) අවු. 10 සිට 24 දක්වා කාල සීමාව

(ii) ඊස්ට්‍රජන්, පොජෙස්ටරෝන්, ටෙස්ටස්ටෙරෝන්

(iii) ශක්තිය / ප්‍රෝටීන් /කැල්සියම් / යකඩ / සින්ක් / අයඩින් / විටමින් A

(07) (i) ආර්තවය නැවතීම / කෑම අරුචිය හා උදෑසන ඔක්කාරය / නිතර මුත්‍රා පිට කිරීමේ අවශ්‍යතාවය / උදරය විශාල වීම

(ii) සිප්ලස් නම් සමාජරෝගය - මෙම රෝගය වැළඳී ඇති මව්වරුනට ආබාධිත දරුවන් ලැබීම, මළ දරු උපත් ඇතිවීම (රෝගයට ල. 1 + හේතු 2 යි. මුළු ලකුණු 03)

(iii) ඩිම්බහරණය - ඩිම්බ කෝෂ තුළ නිපද වූ ඩිම්බයක් පරිතියෙන් පසුව පැලෝපීය නාලය තුළට මුදා හැරීමයි.

අධිරෝපණය - සංයේචනය වීමත් සමඟ සෛල බෙදීම ආරම්භක වේ. සෛල බෙදීම (විභජනය) නිසා සෛල පොකුරක් ලෙස පැලෝපීය නාලය ඔස්සේ ගර්භාෂය කරා පැමිණේ. ගර්භාෂයේ ඇතුළු ආස්තරය වන එන්ඩොමෙට්‍රියම් (අන්තජේදය) තුළ මෙම සෛල පොකුර ගිලී සවි වේ. එය අධිරෝපණය ලෙස හැඳින්වේ.